# මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් පැමිණිලි 1702ක්

## පැෆරල් කියයි

**කුරුණෑගල අතිරේක - පුෂ්පකුමාර ජයරත්න**

පූර්ව මැතිවරණ කාල සීමාව තුළ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් 1702ක් වාර්තා වී ඇති අතර ඉන් පැමිණිලි 1374ක්ම නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් වන ඒවා වන බව පැෆරල් සංවිධානය පවසයි.

පූර්ව මැතිවරණ කාලයේදී ඔක්තෝබර් මස 11 දින සිට නොවැම්බර් 5 දින දක්වා මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පැෆරල් සංවිධානයට සම්බන්ධ දිගුකාලීන නිරීක්ෂකයන්ගෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව මෙම කරුණු අනාවරණය කරගෙන ඇතැයි ද එම සංවිධානය කියයි.

සියලුම දේශපාලන පක්ෂ පසුගිය ජනාධිපතිවරණයට වඩා මෙවර මැතිවරණයේදී නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල නිරතව සිටින බවද, ඊට අදාළව නීති විරෝධී ආකාරයට දේශපාලන පක්ෂ කාර්යාල පවත්වාගෙන යෑමේ සිදුවීම් 155ක් පිළිබඳව තොරතුරු ලැබී ඇති බවද පැෆරල් සංවිධානය සඳහන් කරයි. මැතිවරණ නීති රීතිවලට අනුව දේශපාලන ප්‍රචාරක රැස්වීම්වලදී සංග්‍රහ කිරීම් සම්පූර්ණයෙන්ම තහනම් ක්‍රියාවක් වුවද මෙම කාලය තුළ එවැනි සංග්‍රහ කිරීම් 90ක් ද, ඡන්දදායකයන්ට සංග්‍රහ කිරීම් 8ක් ද වාර්තා වී ඇති බව එම වාර්තාවේ පෙන්වා දෙයි. රාජ්‍ය නිලධාරීන්ද පක්ෂග්‍රාහී ලෙස කටයුතු කරමින් රාජකාරිය පැහැර හැරීමේ සිද්ධීන්ද 12ක් වාර්තාවී ඇතැයිද එම සංවිධානය කියයි.